

ආචාර්ය
**පාලිත ගනේවත්ත**

# සද්ධර්ම රත්නාවලියේ බස්වහර




> පාලියෙන් ගත් කතා වස්තු සිංහලෙන් කීමේදී ධර්මසේන යටීවරයන් යොදාගත් භාෂා විලාසය බෙහෙවින්ම ගැමි බස්වහර ඇසුරෙන් සකස් කර ගත් බව ඉහත දැක්වූ උපමා වලින් පෙනී යයි.

**පැරණි** සිංහල සාහිත්‍ය ග්‍රන්ථ කිහිපයක් විමසුමට ලක් කිරීමේ 'සාහිත්‍ය සම්භාෂණ'' තීරයෙන් පසුගිය කලාපයේදී ධර්මසේන යකිවරයන්ගේ සද්ධර්ම රත්නාවලිය පිළිබඳව කෙටි හැඳින්වීමක් කළෙමු.

සද්ධර්ම රත්නාවලියේ අපූරු භාෂා විලාසය පිළිබඳව මේ සටහනෙන් මදක් විමසා බලමු.

මට්ටකුණ්ඩලී වස්තුවේ දී කෙළ ගණන් වස්තු සම්පත් ඇති අදින්නපුබ්බක බමුණා තුළ තම එකම පුතනුවණට ආභරණයක් කරවන්ට සිතා ඒ සඳහා රන් කරුව-න් ගෙන්වුවහොත් දරන්නට සිදුවන වියදමට හා වස්තු සම්භාරයට ලෝභී අදහසක් පහළ වෙයි. ධර්මසේන හිමියන් මේ අදහස් දක්වන්නේ ''කෙළ ගණන් සම්පත් ඇති තැනැත්තෝ නුග ගස මහත් වත් නුග බලය කුඩා වන්නා සේ'' යනුවෙ-න් අගනා උපමාවක් ඇසුරෙන්ය. දැඩි ලෝභයෙන් මිරිකී තමාම තම පුතුට රන් ආභරණය සකසා දුන් අයුරු පැවසීමට ධර්මසේන හිමියන් යොදාගත් උපමාව ''අකුරු ලියන සේ නොදන්නා කෙනකුන් පත්වල හිරි අඳනා සේ'' යනුවෙනි. අදින්නපුබ්බක බමුණාගේ මට්ටකුණ්ඩලී නම් පුතනුවට පාණ්ඩු රෝගය වැළඳුන අවස්ථාවේදී වරදවා කරන පිළියම් හැඳින්වීමට සද්ධර්ම රත්නාවලියේ කතුවරයා යොදාගත් ''පය බරවාට පිටිකර බෙහෙත් බඳින්නා සේ හා ඇස් සරහන්නට තොර අඳුන් ගාන්නා සේ'' ආදී උපමා දෙක කෙතරම් උචිත දැයි වහා වැටහී යන්නේය.

ටුලතිස්ස තෙරුණු වහන්සෙ-ගේ වස්තුව සද්ධර්ම රත්නාවලියේ ඇති අගනා කතා ප්‍රවෘත්තියෙකි. පිළිවෙත් පිරීමට යෝග්‍ය වූ බාල කල ගිහි ගෙයිම හිඳ වැඩි මහලු කල මහණ වූ ටුල්ලතිස්ස තෙරුණ් ධර්මසේන හිමියන් විසින් හඳුන්වා දී ඇත්තේ ''ඔබ වැළත් ගොයම් කළමනා වත තබා පියා කල්පසු කොට කරන ගොයමක් සේ'' යනුවෙනි. බාල තෙරුන් වහන්සේලාගෙන් දෝෂාරෝපණයට ලක්වූ ටුල්ලතිස්ස තෙරුණ් හඬමින් වැළපෙමින් බුදුන් වහන්සේ කරා ගියසැටි වර්ණනා කොට ඇත්තේ ''නියන් සමයේ හඬන අහසක් මෙන් ගර්ජනා කොට ගෙන'' යනුවෙනි. තරහෙන් කළ ගිගිරීම හා බුදුන් තුළ අනුකම්පාවක් උපදවන අයුරින් බොරුවට හඬා ගෙන යමින් හැඳින්වීමට ''නියන් සමයේ හඬන අහසක් මෙන්'' යන්න තරම් උචිත උපමාවක් සිංහල ජන බස් වහරෙන් සොයා ගත නොහැකිය. නියන් කාලයේදී වැසී නොවසී. අහස ගොරවයි. වැසි නොවැටෙන බැවින් එම අහස ගෙරවීම අප සැම මුලා කරවන ව්‍යාජ ගෙරවිල්ලකි.

පාලියෙන් ගත් කතා වස්තු සිංහලෙන් කීමේදී ධර්මසේන යටීවරයන් යොදාගත් භාෂා විලාසය බෙහෙවින්ම ගැමි බස්වහර ඇසුරෙන් සකස් කර ගත් බව ඉහත දැක්වූ උපමා වලින් පෙනී යයි. උන්වහන්සේ ගැමි ජනතාව සමග සුහදව ජීවත් වෙමින් ගැමියන්ගේ එදිනෙදා ජිවිතය, ජීවන උපාය, ඇදහිලි, සිරිත් විරිත් පිළිබඳ මනා අවබෝධයකින් සිටි බව හෙළි කරන වර්ණනා සද්ධර්ම රත්නාවලියේ බහුලය.

දේවදත්ත වස්තුවේ උපුටා පහත දැක්වෙන වර්ණය සිංහල ගැමියාගේ ප්‍රධාන ජීවනෝපාය වන කුඹුරු ගොවිතැන් සියලුම අවස්ථා කැටිකොට දක්වන අගනා සිද්තමක් මවා පායි. ධර්මසේන යතිවරයන් මෙවන් බසක් වර්ණනා කරන්නට සමත් වූයේ ගැමි ජීවිතය පිළිබඳ ඉතාම සුහද අවබෝධයක් උන් වහන්සේ තුළ පැවැති නිසා බව සැක නැත.

''පළමු කොට කුඹුරු ගෙවඩිය යුතුය. ඉක්බිති බිම් නැඟිය යුතුය. පසුව දෙසී සෑම යුතුය, මියර කෙටිය යුතුය. තුන් සී සාන්නට යුතුය. කැට කළා පෝරු ගෑ යුතුය. කලල්ලම් කට යුතුය, ඉස්තන් තෙමිය යුතුය, දිය බැන්ද යුතුය, ගොයම් රෝගයට කෙම් කළ යුතුය, ගෝයම් පැසී ගිය කලට දා මැඩ වී අටු කොටු වලට ලිය යුතුය. පෙරළා හිපිනැලි සෑව යුතුය. වල්පොළ කෙටිය යුතුය. දවා හෙළි කට යුතුය. වපුල යුතුය. මාස් සමයැ ගොයම් පැසී ගිය කලටද මෙලෙසටම කට යුතුය.''

සද්ධර්ම රත්නාවලියේ භාෂා විලාසය විමසීමේදී පෙනී යන තවත් වැදගත් කරුණක් ගැන සඳහන් කල යුතුය. එනම් සිංහල භාෂාවේ විවරණ රීති රැසක් මෙම මාහැඟි පැරණි ග්‍රන්ථය මගින් අපට හඳුන්වා දී තිබීමයි. ගියත්, කළත් යන ආදී වශයෙන් දැන් යෙදෙන ''ත්'' නිපාතය වෙනුවට සද්ධර්ම රත්නාවලියේ යෙදී ඇත්තේ 'ද්' නිපාතයයි. ''පවතී'' , ''දකී'' යනුවෙන් දැන් අප වහරන පද සද්ධර්ම රත්නාවලියේ යෙදී ඇත්තේ ''පවත්තී'', ''දක්කී'' යනුවෙනි.

සද්ධර්ම රත්නාවලිය ධර්ම ග්‍රන්ථයක් පමණක් නොවේ. එහි ඇතුළත් හාස්‍ය රසයෙන් පිරි කතා වස්තුව බෞද්ධ අබෞද්ධ සැදැහැවත් නොවන අයගේ පවා කට කොනක සිනා නඟන්නකි. මෙයට මූලික හේතුව ගැමියන් සමඟ ජීවත් වී ජීවිතය නමැති තක්සලාවෙන් ලත් සුහද දැනුම ඇති ධර්මසේන හිමියන් උපයෝගී කරගත් ගැමි වහර මුසුවුණු භාෂා විලාශයයි.

ෆිජි කඩේ.. අපේ කඩේ..
**Moonee Ponds**

* Sri Lankan and Indian Spices and Groceries
* Frozen Fish and Frozen Indian food delicacies
* Sri Lankan Weekly News Papers
* Sinhala, Tamil and Indian Tele-dramas in VHS & Indian Movies in VCDs and DVDs
* Fresh Asian Vegetables
* Sri Lankan Take-away
* Ready to eat meal packs

JagathJE

සෑම බ්‍රහස්පතින්දාම
සිංහල එළවළු

For all your Asian grocery needs.
Come and Talk to friendly staff
at our store.

INDIAN SRI LANKAN GROCERY SHOP
**FIJI PRODUCTS**
Shop 7/34 Aspen Street
Moonee Ponds 3039
Tel– 03-9370 3813

## තිළිණ අතිරේකය

පසුගිය දෙසැම්බර් මාසයේ සිට

**සන්නස**

තිළිණ නමින් අතිරේකයක් නිකුත් කරයි.
මේ අතිරේකය සකස් කර ඇත්තේ මව් පුවත්පතින් වෙන් කරගෙන එකතු කරගත හැකි වන සේ ය.
සෑම මාසයකම තිළිණ අතිරේකය එකතු කරන්න කලකදී එය රසවත් පොතක් බවට පත් වනු ඇත.